## අධ්‍යාපනය

ජපන් අධ්‍යාපනය 1947 දී සම්මත වූ "අධ්‍යාපනය පිළිබඳ මූලික නීතිය" සහ "පාසල් අධ්‍යාපන නීතිය" යන නීති මත ක්‍රියාත්මක වේ. ඒ අනුව වයස අවුරුදු 15 දක්වා පාසල් යාම අනිවාර්ය වන අතර ඒ කාලය තුළ නිදහස් අධ්‍යාපනය ලබා ගත හැකි ය.



රූපය 5.19
**කනිෂ්ඨ පාසලක දිවා ආහාර වේලක්**

දෙවන ලෝක යුද්ධයෙන් පසු ව ජපානයේ අධ්‍යාපන කටයුතු මෙහෙය වනුයේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟිනි. පුස්තකාල, කෞතුකාගාර හා විවිධ ආයතන ද අධ්‍යාපන කටයුතුවලට දායක වේ.

1966 වන විට ජපාන විශ්ව විද්‍යාලවලට එක්සත් ජනපදය, කොරියාව, චීනය යන රටවලින් ද විද්‍යාර්ථීහු 6990ක් පැමිණියහ. ජපන් විශ්ව විද්‍යාලවල විද්‍යාර්ථීන්ගෙන් 30%ක් ඒ වන විට විද්‍යා විෂයයන් හදාරන ලදී.



රූපය 5.20
උසස් කනිෂ්ඨ පාසලක පංති කාමරයක සිසු සිසුවියන්

## ආගමික හා සංස්කෘතික තත්ත්වය

ජපානයේ ප්‍රධාන ආගම් වන්නේ බුදු දහම හා ෂින්ටෝ ආගම යි. විවාහ සහ අවමංගල චාරිත්‍රවල දී බහුල ව ආගමික බලපෑම දැකිය හැකි ය. කොන්පියුසියස්ගේ ඉගැන්වීම් ද දර්ශනයක් ලෙස පවතී. නව ව්‍යවස්ථාවට අනුව රජය කිසිදු ආගමික ඉගැන්වීම් කටයුත්තකට ඉදිරිපත් නො වේ.

චිත්‍ර සහ ප්‍රතිමා කලාවන් අතින් ද ඉපැරැණි යුගයේ පටන් ජපානය ප්‍රසිද්ධියක් දරන අතර 19 වැනි සියවසින් පසුව බටහිර ආභාසය ලබා ඇත. ජපානයේ උකියොච් නම් චිත්‍ර කලාව යුරෝපයට ද බලපා ඇත. එමෙන් ම ජපානයේ වාර්ෂික ව පැවැත්වෙන "තෝකියෝ බයිනේල්" නම් චිත්‍ර ප්‍රදර්ශනය ලොව විශාල ම චිත්‍ර ප්‍රදර්ශන සතරෙන් එකකි.



රූපය 5.21 ජපන් බුදු පිළිමයක්

සම්ප්‍රදායික සංගීතය මෙන් ම බටහිර සංගීතය ද ජපානයේ ඉතා ප්‍රසිද්ධ ය. 1961 ජපානයේ පැවති පෙර අපර දෙදිග සංගීත සංදර්ශනය එයට හොඳ ම උදාහරණයකි. ක්‍රීඩා කෞශල්‍යය අතින් සම්ප්‍රදායික සුමෝ, ජූඩෝ සහ කෙන්දෝ (කඩු හරඹ) ඉතා ප්‍රකට ය. 1946 දී ටෝකියෝවේ පැවති 18 වන ඔලිම්පික් තරගයෙන් බොක්සිං, මල්ලව පොර, වොලිබෝල්, බර ඉසිලීම, ජූඩෝ, ජිම්නාස්ටික් වැනි තරගවලින් රන් පදක්කම් දිනා තෙවන ස්ථානය හිමි කර ගැනීමට ජපානය සමත් විය. බේස්බෝල්, ගොල්ෆ් හා පිහිනීම ඉතා ජනප්‍රිය ව ඇත.

වර්තමානය වන විට ජපානය ලොව ධනවත් ම හා ඉහළ ම කාර්මික ඥානය හිමි රට බවට පත් ව ඇත. ජපාන ජනතාවගේ ඵලදායිතාව 2006 වර්ෂයේ දී 104%කි. ලොව උසස් ම ජීවන තත්ත්වයක් ඇති රටකි. මෙසේ ජපානය දෙවන ලෝක මහා සංග්‍රාමයෙන් ඇද වැටුණ ද සම්ප්‍රදායික කලාවන් සහ සංස්කෘතික අංග රැක ගනිමින් නවීන තාක්‍ෂණය හා යහපත් ආකල්ප තුළින් දියුණු ජාතියක් බවට පත් ව ඇත. ඒ අනුව දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු ව ගොඩ නැගුන ලෝක බල කඳවුරු කිසිවකුට අයත් නො වූ නමුත් ලෝක බලවතකු ලෙස නැගී සිටීමට ආසියාතික රටක් වූ ජපානය සමත් විය.



රූපය 2.22 අලුත් අවුරුදු නිවාඩුවට පන්සල් ජනයාගෙන් පිරී පවතී

## අභ්‍යාස

### පිළිතුරු සපයන්න.

1. පළමුවන හා දෙවන ලෝක යුද්ධ සඳහා එක්සත් ජනපදය සහභාගී වීමට බලපෑ හේතු මොනවා ද?
2. එක්සත් ජනපදය ධනවාදී කඳවුරේ නායකත්වයට පත් වීමේ දී අනුගමනය කළ ක්‍රියාමාර්ග මොනවා ද?
3. වර්තමානයේ සමාජවාදී පාලනයක් පවතින රටවල් 3ක් නම් කරන්න.
4. සීතල යුද්ධය යනු කුමක් දැ යි පැහැදිලි කරන්න.
5. මෙම පාඩමෙහි සඳහන් නොවන එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් 3ක් ලියන්න.
6. එක්සත් ජනපද හමුදාවන් ජපානයට පැමිණීමේ ප්‍රධාන අරමුණු දෙක මොනවා ද?

### පහත දැක්වෙන වරහන් තුළ ඇති පද අතුරින් සුදුසු ඒවා තෝරා හිස්තැන් පුරවන්න.

(නේටෝ සංයුතිය/පස් අවුරුදු සැලැස්ම/වුඩ්රෝ විල්සන්/ශ්‍රී ලංකාව /ඉන්දියාව/යුගෝස්ලාවියාව/ඊශ්‍රායලය/සූවස් ඇළ/ප්‍රැන්ක්ලින් ඩෙලනෝ රූස්වෙල්ට්/1961/වෝර්සෝ)

### හිස්තැන් පුරවන්න

1. ජාතීන්ගේ සංගමය පිහිටුවීමේ දී මූලිකත්වය ගෙන ක්‍රියා කෙළේ ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපති.....................ය.
2. දෙවන ලෝක මහා සංග්‍රාමය වන විට එක්සත් ජනපද ජනාධිපති ධුරය දැරුවේ.....................ය.
3. උතුරු අත්ලන්තික් ගිවිසුම් සංවිධානය.................................යන කෙටි නාමයෙන් හඳුන්වයි.
4. 1948 දී ඉදිරිපත් කළ බැල්ෆර් ප්‍රකාශනය මගින් .............................. නම් රාජ්‍යය පිහිටුවනු ලැබිණි.
5. නේටෝ සංවිධානයට මුහුණදීම සඳහා සමාජවාදී රටවල් විසින්.......................... සංවිධානය පිහිටුවා ගන්නා ලදී.
6. රුසියාව තම ආර්ථිකය දියුණු කොට ගැනීමට ............................. ක්‍රියාවට නැංවීය.
7. ඊජිප්තු ජනාධිපති අබ්දුල් ගමාල් නසාර් විසින් 1956 දී ...............................ජන සතු කරන ලදී.